**මහනුවර කඩවත්සතර සහ ගගවට කෝරලේ ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

--------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජනවාරි 16 දින සභාවේ, සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගගවට කෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනයට අනුව, ඉඩම් කොටස් 11 ක වටිනාකම තක්සේරු කර, ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දි වෙන්දේසි කර තිබුණු රු.32,000 ක් වටිනා ස්කූටරය, මෝටර් රථ හා කරත්ත ස්ථාවර වත්කම් ගිණුමේ තවදුරටත් දක්වා තිබුණි.

(ඇ) බෙහෙත් ද්‍රව්‍ය මිලට ගැනීම වෙනුවෙන් 2013 පෙබරවාරි මස ලබා දි තිබුණු රු.76,490 ක අත්තිකාරම් මුදලින් අදාළ බෙහෙත් ද්‍රව්‍ය තොගය 2013 මාර්තු 23 දින සභාවට ලැබී කොටසක් භාවිතයට ගනිමින් පැවතියදීත්, එම වටිනාකම ගබඩා අත්තිකාරම් වශයෙන් ගිණුමේ තවදුරටත් දක්වා තිබුණි.

(ඈ) 2006 සිට 2012 කාලයට අදාළව සභාවේ නිලධාරීන් 06 දෙනෙකුට ගෙවන ලද රු.188,111 ක හිඟ වැටුප් හා වැටුප් වර්ධක සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

----------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාළ පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.15,650,621 ක් වූ අතර, උපලේඛන අනුව, එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.15,941,383 ක් වූයෙන්, රු.290,762 ක වෙනසක් අනාවරණය විය.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

------------------------------------

(අ) **ලැබියයුතු ගිණුම්**

----------------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.65,591,469 ක් වූ අතර, එයින් රු.38,154,823 ක් අවුරුදු 01 ත් 12 ත් අතර කාලයක සිට ඉදිරියට ගෙන එන ශේෂයන් වන අතර, එම ශේෂයන් සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ගෙවියයුතු ගිණුම්**

2013 දෙසැම්බර් 31 දිනට වියදම් ණයහිමි ශේෂවල එකතු වටිනාකම රු.62,683,036 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ණයහිමි ශේෂයන් හී එකතුව රු.26,424,452 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම් විෂයයන් 04 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන්, එකතුව රු.34,030,085 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට

නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම

පහත සදහන් නීති, රිති හා රෙගුලාසීවලට අනුකූල නොවූ අවස්ථා නිරික්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u> | |
| | 132(ඒ) වගන්තිය. | සභාවේ අරමුණුවලට අදාළ නොවන අධ්‍යයන පාඨමාලා හැදැරීම සඳහා උප සභාපතිවරයාට හා මන්ත්‍රීවරයෙකුට රු.87,814 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසී සංග්‍රහය. | |
| | මු.රෙ. 371(2) | අත්තිකාරම් ලබා ගෙන, ඊට අදාළ කාර්යය නිම වූ වහාම පියවීමට කටයුතු කළයුතු වුවත්, වසර 01 සිට වසර 07 ක් දක්වා |

| | | |
|---|---|---|
| | | කාලයක් තුළ අවස්ථා 18 කදී ලබා ගෙන තිබුණු රු.100,422 ක අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1982 අංක 04 සහ 1984 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත සහ 2009 අප්‍රේල් 11 දිනැති අංක 1597/8 දරන ගැසට් නිවේදනය. | සභා බල ප්‍රදේශයේ ස්ථාන 04 ක අනවසර නිවාස ඉදි කිරීම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි . |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,156,167 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,272,187ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.28,883,980 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

--------------------------------------------

**ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

------------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | ---------------- | ------------------- | ------ | --------------------- |
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 10,713 | 6,290 | 8,925 |
| (ii) | බදු කුලී | 313 | 57 | 158 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,707 | 2,874 | 131 |
| (iv) | වෙනත් ආදායම් | 11,672 | 38,485 | 42,653 |

**2.2.2 වරිපනම්**

-----------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී, රු.7,666,265 ක වරිපනම් බදු හිඟයක් පැවති අතර, වර්ෂයේ අවසාන දිනට රු.6,137,424 ක මුදලක් තවදුරටත් අය නොවී පැවතුණි. ඒ අනුව, වර්ෂය තුළ හිඟ වරිපනම් බදුවලින් අය වී තිබුණේ සියයට 20 ක් පමණි.

(ආ) රු.4,000 ට වැඩි වරිපනම් බදු අය කරනු ලබන වරිපනම් ඒකක 234 කින් අවුරුදු 03 ත් 20 ත් අතර කාලයක සිට රු.1,974,353 ක වරිපනම් බදු මුදලක් හිඟව පැවතුණි.

(ඇ) බෝවල උප කාර්යාලයට අනුබද්ධිත කලාපයේ රජයේ ආයතන 14 ක අවුරුදු 05 ක කාල පරාසයකට වඩා වැඩි කාලයක සිට හිඟ වරිපනම් බදු රු.123,640 ක් 2014 ජූනි 30 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **බදු කුලී**

------------

2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 කට වඩා වැඩි කාල පරිච්ඡේදයක සිට අය වියයුතු රු.157,527 ක බදු කුළී, අය කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

2.2.4 **බලපත්‍ර ගාස්තු හා කසළ බදු**

--------------------------------

වසර 02 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන රු.130,710 ක හිඟ හිටි බලපත්‍ර ගාස්තු හා හිඟ හිටි කසළ බදු රු.51,780 ක් අය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.5 **හිඟ හිටි විදුලි ගාස්තු**

----------------------

වසර 10 කටත් වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන රු.2,734,948 ක ලැබියයුතු විදුලි ගාස්තු ආදායමක් අය කර ගැනීමට හෝ විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර, නිරවුල් කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි.

2.2.6 **මුද්දර ගාස්තු**

----------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.36,843,639 ක් ලැබියයුතුව පැවතුණි. මෙම ශේෂය 2003 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන අතර, එම මුදල් සොයා බලා, අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

3.1 **කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

---------------------------------------

සමාලෝචිත වර්ෂයේ මුලු ජංගම වත්කම් සමග ජංගම වගකීම් දැක්වෙන අනුපාතය 1:0.81 වු අතර,ඉකත් වර්ෂයේ අනුපාතය 1:0.91 වූයෙන්, මෙම අනුපාතයන් ප්‍රශස්ථ මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය. සමස්ත ජංගම වත්කම්වලින් සියයට 50 ක් හෙවත්, රුපියල් මිලියන 54 ක් ආදායම් ණයගැතියන් වු අතර, මුලු ජංගම වගකීම්වලින් සියයට 70 ක් හෙවත්, රුපියල් මිලියන 62 ක් විවිධ ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාන මාරුවී ගොස් ඇති, වැඩ තහනමට ලක්වී, විශ්‍රාම ගොස් ඇති හා මිය ගිය සේවකයින් හතළිස්දෙනෙකුගෙන් වසර 03 සිට වසර 10 කටත් වඩා වැඩි කාල පරාසයක සිට අය නොවී පවතින රු.847,686 ක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වූ වසර 05 කටත් වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන එකතුව රු.1,224,583 ක ණයගැති ශේෂ අයිතම් 04 ක වටිනාකම් අය කර ගැනීමට හෝ විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නිරවුල් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

3.3 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.6,487,162 ක වටිනාකමක් වූ ජල කර්මාන්ත ද්‍රව්‍ය තොගය අවුරුදු 10 කට වඩා වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතුණි.

3.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබෙ

(අ) **තැන්නේකුඹුර තේක්කවත්ත මාර්ගය**

-----------------------------------------

රු.500,000 ක් වැය කර තැන්නේකුඹුර, තේක්කවත්ත මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් අතුරා 2013 නොවැම්බර් 30 දින වැඩ නිම කර තිබුණි. ඉදි කිරීමට අදාළ ගෙවීම් වාර්තාවේ වැඩ විෂයය අංක 04 යටතේ 1:2:4 ($^3/4$") මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් ආරක්ෂිත වැටිය 6" ක් පළලට සහ 9" ක් උසට යෙදියයුතු වුව ද, මාර්ගයේ අවසාන කෙළවර දකුණු පස සිට ආරක්ෂිත වැටියේ උස 6½ ", 7", 7½ " සහ 9" ක් ද, මාර්ගයේ මුල් කොටසේ දකුණු පස නිවාසය අසළ එහි උස 1½ ", 2", 2½", සහ 3½ " ආදී ප්‍රමාණයන්ගෙන් ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩුවෙන් ඉදි කර තිබුණි.

(ආ) **බෝවලවත්ත සෙත්සිරි වෙළඳ සැළ අසළින් ඉදිරිපසට යන මාර්ගය සංවර්ධනය කිරීම**

-------------------------------------------------------------------------------------------

රු.500,000 ක් වැය කර, බෝවලවත්ත, සෙත්සිරි වෙළඳ සැළ අසළින් ඉදිරියට යන මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් අතුරා 2013 දෙසැම්බර් 20 දින වැඩ නිම කර තිබුණි. මෙහි වැඩ විෂයය අංක 03 ට අනුව, මාර්ගය දෙපස යොදා තිබූ කොන්ක්‍රීට් ආරක්ෂිත වැටිවල උස 10" ක් වෙනුවෙන් ගෙවීම් කර තිබුණ ද, එහි උස 7", 8", සහ 9" ආදී ප්‍රමාණයන්ගෙන් ඉදි කර තිබුණි.

(ඇ) **රදාගස්වත්ත මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇතිරීම**

---------------------------------------------------------------

රු.500,000 ක් වැය කර, රදාගස්වත්ත මාර්ගයේ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් අතුරා 2013 දෙසැම්බර් 19 දින වැඩ නිම කර තිබුණි. මාර්ගයේ කොන්ක්‍රීට් ආරක්ෂිත වැටිවල උස 9" ක් වෙනුවෙන් ගෙවීම් කර තිබුණ ද, එය 4 ½ " සහ 4" ප්‍රමාණයන්ගෙන් ඉදි කර තිබුණි.

(ඈ) **කැටවල සුසාන භූමිය අසළින් ගමමැද පාර සංවර්ධනය කිරීම**

-------------------------------------------------------------------------

රු.500,000 ක් වැය කර, කැටවල සුසාන භූමිය අසළින් ගමමැද පාර අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් අතුරා 2014 ජනවාරි 10 දින වැඩ අවසන් කර තිබුණි.

(i) ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 04 යටතේ 1:2:4 ($^{3/4}$") සිමෙන්ති, වැලි, ගල් මිශ්‍රණයෙන් මාර්ගයේ දෙපස කොන්ක්‍රීට් ආරක්ෂිත බැම් සඳහා ඝන මීටර් 5.50 ක් වෙනුවෙන් රු.85,140 ක් ඇස්තමේන්තු කර තිබිය දී, ඝන මීටර් 6.61 සඳහා රු.102,322 ක් ගෙවිම් කර තිබුණි.

(ii) වැඩ විෂයය අංක 04 යටතේ ඉදි කළ කොන්ක්රීට් ආරක්ෂිත වැටියේ පළල 6" ක් හා උස 9" ක් වෙනුවෙන් ඝන මීටර් 6.61 ක් සඳහා රු.102,322 ක් ගෙවීම් කර තිබුණ ද, ආරක්ෂිත වැටිවල උස 4½"සහ 5" ආදී ප්‍රමාණයන්ගෙන් ඉදි කර තිබුණි.

(ඉ) **මී කණුව වික්ටෝරියා උද්‍යාන මාර්ගය සංවර්ධනය කිරීම**

-----------------------------------------------------------------

රු.433,545 ක් වැය කර, මී කණුව වික්ටෝරියා උද්‍යාන මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් අතුරා 2014 මැයි 23 දින වැඩ අවසන් කර තිබුණි.

(i) මාර්ගයේ යොදා තිබූ කුට්ටි ගල් අඩි 30 ක් දිගට හා අඩි 02 ක් පළලට ගිලා බැස තිබුණි.

(ii) වැඩ විෂයය අංක 04 යටතේ 1:2:4 (3/4") සිමෙන්ති, වැලි, ගල් මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් ආරක්ෂිත වැටියේ පළල 6" ක් ද, උස 9" ක් වෙනුවෙන් ඝන මීටර් 5.58 ක් සඳහා රු.86,378 ක් ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දි, මාර්ගයේ දිග අඩි 15 ක කොන්ක්‍රීට් ආරක්ෂිත වැටිවල උස ½ " ක් වූ අතර, මාර්ගයේ ඉතිරි කොටස අවස්ථා 02 කදි සිදු කරන ලද පරීක්ෂාවේ දි ආරක්ෂිත වැටිවල උස 7 ½ " සහ 4 ½ " ක ප්‍රමාණයෙන් ඉදි කර තිබුණි.

(ඊ) **පොල්වත්ත ඉහළ කොටස කොන්ක්‍රීට් කිරීම**

-------------------------------------------------

රු.485,000 ක් වැය කර, පොල්වත්ත ඉහළ කොටස මාර්ගය කොන්ක්‍රීට් අතුරා 2013 ඔක්තෝබර් 03 දින වැඩ අවසන් කර තිබුණි. මෙම මාර්ගය දිග අඩි 900 ක් හා පළල අඩි 09 කින් සමන්විතව අඟල් 04 ඝනකමින් 1:2½ :5 (අඟල් 01) සිමෙන්ති, වැලි, ගල් මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් කිරීම සඳහා කියුබ් 2.97 ක් වෙනුවෙන් රු.100,671 ක් ගෙවීම් කර තිබුණ ද, මාර්ගයේ ඝනකම 2 ½, 3" සහ 4" ක් ආදී ප්‍රමාණයෙන් ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුකූල නොවන පරිදි ඉදි කර තිබුණු බවත් අනාවරණය විය.

(උ) **අම්පිටිය මැද්දේගම පාර කොන්ක්‍රීට් කිරීම**

--------------------------------------------------

රු.500,000 ක් වැය කර, අම්පිටිය, මැද්දේගම පාරේ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් අතුරා 2013 දෙසැම්බර් 29 දින වැඩ නිම කර තිබුණි. මෙහි වැඩ විෂයය අංක 04 යටතේ 1:2:4 (මි.මී.19) සිමෙන්ති, වැලි, ගල් මිශ්‍රණයෙන් පළල 6" ක් හා උස 9" ක ප්‍රමාණයෙන් ඉදි කිරීම සඳහා ඝන මීටර් 5.72 ක් වෙනුවෙන් රු.88,245 ක් ගෙවීම් කර තිබුණ ද, අවස්ථා 04 ක දි සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දි කොන්ක්‍රීට් ආරක්ෂිත වැටිවල උස 7" ක් බව නිරීක්ෂණය විය.

4. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---

4.1 **ප්‍රසම්පාදන සැළැස්ම**

---

සමාලෝචිත වර්ෂය තුළ රු.61,838,904 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණ ද, ඒ සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

4.2 **අභ්‍යන්තර විගණනය**

---

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

4.3 **අයවැය පාලනය**

---

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 31 දින වන විට වැය ශීර්ෂ 28 ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා, වෙනත් වැය ශීර්ෂ 25 කින් රු.2,898,000 ක් වු ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණි.

(ආ) නිසි අධ්‍යානයකින් හා සැළසුම් කිරීමකින් තොරව අධි ඇස්තමේන්තු පිළියෙළ කිරීම නිසා, වැය ශීර්ෂ 06 ක ප්‍රතිපාදන සියයට 15 සිට සියයට 60 ක පරාසයකින් ඉතිරි වී තිබුණි

(ඇ) නිසි අධ්‍යයනයකින් හා සැළසුම් කිරීමකින් තොරව ඌන ඇස්තමේන්තු පිළියෙළ කිරීම නිසා, වැය ශීර්ෂ 10 ක සියයට 6 සිට සියයට 100 ක පරාසයකින් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා, වෙනත් වැය ශීර්ෂවලින් මාරු කර ගෙන තිබුණි.

(ඈ) වැය ශීර්ෂ 20 කට අදාළව වෙන් කර තිබු රු.1,647,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් සමග වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සැසඳීමේ දි, ආදායම් විෂයයන් 05 ක් සියයට 39 සිට සියයට 426 ක් හා වියදම් විෂයයන් 03 ක් සියයට 23 සිට සියයට 46 ක් දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වුයෙන්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොතිබුණි.

(එ) කසළ බදු ආදායම් උප විෂයය වෙනුවෙන් රු.400,000 ක මුදලක් ඇස්තමේන්තු කළත්, ඉන් කිසිදු ආදායමක් අය කර ගැනීමට සමත් වී නොතිබුණි.

(ඒ) ආදායම් විෂයයන් 04 ක එකතුව රු.36,672,410 ක ඇස්තමේන්තුගත ආදායමින් රු.7,981,462 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයා ගැනීමට හැකි වී තිබුණි.

## 5. පද්ධති හා පාලන

------------------------

පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය